**නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන - 2020**

**-----------------------------------------------------------**

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3119 එස්ආර්අයි (එස්එෆ්) සහ 3120 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුම්වල iv ව්‍යවස්ථාවේ 4.04(අ) වගන්තිය සහ 2018 මැයි 11 දින එළඹි අංක 3650 එස්ආර්අයි(සීඕඑල්) සහ 3651 එස්ආර්අයි දරන අතිරේක ණය ගිවිසුම් වල විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මගේ අදහස් හා නිරීක්ෂණය මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහන් කාලය

**------------------------------------------------------------------------------------------**

ණය ගිවිසුම අනුව, එවකට නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය එනම් වත්මන් අධ්‍යාපන අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර අනෙකුත් ආයතන 10 ක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. 2020 වනවිට දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපලේ ඉල්ලුම සපුරාලීමට කාර්යක්ෂම අධ්‍යාපන පද්ධතියක් ගොඩනැගීම හා වෘත්තීය පුහුණුව සඳහා තත්ත්වය, අදාළතාවය, ප්‍රවේශය, පිළිගැනීම මෙන්ම උපකාරක ප්‍රතිපත්ති, පද්ධති හා ආකෘති වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. වැඩසටහන් ක්‍රියාකාරකම් ප්‍රතිඵල පදනම් (lending mode) ක්‍රමය අනුව ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 141,524.23 කට සමාන එජඩො මිලියන 1,061.2 ක් වූ අතර ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය පිළිවෙලින් රු.මිලියන 28,708.23 කට සමාන එජඩො මිලියන 200 ක්ද, රු.මිලියන 13,100 කට සමාන එජඩො මිලියන 100ක්ද බැගින් ලබාදී තිබුණි. ඉතිරිය එජඩො මිලියන 761.2 ක් ජර්මන් රජය, කොරියාවේ අපනයන හා ආනයන බැංකුව, ශ්‍රී ලංකා රජය හා අනෙකුත් ප්‍රභවයන් විසින් මූල්‍යයනය කර තිබුණි. වැඩසටහනෙහි කටයුතු 2014 වර්ෂයේ සැප්තැම්බර් ආරම්භ කරන ලද අතර 2021 ජුනි 30 වනවිට නිම කිරීමට නියමිතය.

## 1.3 මතය

**------**

ආයතන 11 හි මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති තොරතුරුවලට අනුකූලව 2020 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය **සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------------**

මෙම ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය ඒජන්සි 11 හි මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති තොරතුරුවලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයක් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතිය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 ඒකාබද්ධ මුළු වියදම් ප්‍රකාශය විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇති විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින්, වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තු හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සමස්ත ඉදිරිපත් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම. හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව වගකීම් දරන්නන් දැනුවත් කරන ලදී.

**2.** **භෞතික කාර්යසාධනය**

**2.1** **ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| | 2020 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික ප්‍රගතිය | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අසියානු සංවර්ධන බැංකු ණය ගිවිසුම් ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විට ළගා කර ගත යුතු උපයෝජන දර්ශක 9 යටතේ වූ ඉලක්කයන් 51 න් 18ක් ලගා කර ගැනිමට නොහැකි වී තිබුණි. | ආසියානු සංවර්ධන බැංකුවේ ණය ගිවිසුමට අනුව, සියළුම උපයෝජන දර්ශක 2021 ජුනි 30 දිනට සම්පූර්ණ කිරිමට නියමිතව ඇත. කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රධාන වශයෙන් පුහුණු මධ්‍යස්ථාන සහ කර්මාන්ත කටයුතු වසා දැමීම නිසා ප්‍රමාද වීම සිදු විය. | ණය ගිවිසුම් යටතේ වන උපයෝජන දර්ශකයන්හි ක්‍රියාකාරකම්වල ඉලක්කයන් සපුරා ගැනීම කෙරෙහි කළමණාකරණයේ අවධානය යොමු විය යුතුය. |
| (ආ) | ආසියානු සංවර්ධන බැංකු ණය ගිවිසුම් අංක 3650 සහ 3651 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසන් වන විට එජඩො 100,000,000 ක් ප්‍රතිපූර්ණය කරගත යුතුව තිබුණද , එකතුව එජඩො 36,280,000 ක් ප්‍රතිපූර්ණය කර ගැනිමට නොහැකි වී තිබුණි. | ආසියානු සංවර්ධන බැංකු ණය ගිවිසුමේ සඳහන් කර ඇති පරිදි , 2021 දෙසැම්බර් 31 දින වන විට එජඩො මිලියන 100 ක ප්‍රතිපූර්ණය කරගත යුතුය. | අරමුදල් පරිහරණය කිරීමේ අකාර්යක්ෂමතාවය පෙන්නුම් කර ඇත. ව්‍යාපෘතියේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

**2.2** **කොන්ත්‍රාත් පරිපාලනය**

| | විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට ජාතික තරුණසේවා සභාවේ ආංශික නිපුණතා සංවර්ධන අරමුදල් යටතේ රු. 84,216,614 ක් වැයකර තිබූ ව්‍යාපෘති 2 ක් කොන්ත්‍රාත්කරු විසින් වැඩ ප්‍රමාද කිරීම හේතුවෙන් 2018 අගෝස්තු සිට වැඩ නවතා දැමීමට කටයුතු කර තිබුණි. | කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදයන් හේතුවෙන් දඹුල්ල පුහුණු මධ්‍යස්ථානයේ ප්‍රතිසංස්කරණ කටයුතු සහ ත්‍රිකුණාමලය පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමේ කටයුතු අවසන් කිරීමට කටයුතු කළ අතර භාණ්ඩාගාර අරමුදල් මඟින් එම කටයුතු කරගෙන යනු ලැබේ. | ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට වහාම පියවර ගත යුතුය. |
| (ආ) | ප්‍රගති වාර්තාවට අනුව, ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ | අදහස් දක්වා නැත. | ඉදි කිරීම් හා නවීකරණය සඳහා හඳුනාගෙන ඇති පුහුණු |

| | | | |
|---|---|---|---|
| | අධිකාරියේ පුහුණු මධ්‍යස්ථාන 4 ක වැඩිදියුණු කිරීමේ කටයුතු 2019 නොවැම්බර් අවසන් කිරීමට නියමිතව තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසන්වනවිටත් වැඩිදියුණු කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. ව්‍යාපෘති යෝජනාව ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ද නොතිබුණි. | | මධ්‍යස්ථාන වල සිවිල් කටයුතු කඩිනම් කිරීම සඳහා විශේෂ අවධානය යොමු කළ යුතුය. |
| (ඈ) | රත්මලාන නව ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2014 අගෝස්තු 5 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණද ඉදිකිරීම් කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිම වී නොතිබුණි. ප්‍රමාද වීමේ කාලය වසර 5 කටත් වඩා වැඩි වූ අතර ඉදිකිරීම් පිරිවැය රු. මිලියන 200 කි. මෙම වැඩසටහන 2019 අගෝස්තු මාසයේදී අවසන් කිරීමට නියමිතව තිබූ අතර ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 2020 දෙසැම්බර් 31 දින වන විට සියයට 60 ක් පමණි. | ජෛව බුබුලු සංකල්පය යටතේ වීටීඒ රත්මලාන ගොඩනැගිල්ල ඉදිකිරීම සෙමෙන් සිදු වන නමුත් භෞතික ප්‍රගතිය වැඩ විෂය පථයෙන් සියයට 95 කි. ඉතිරි වැඩ කටයුතු 2021 ඔක්තෝම්බර් මාසයේදී අවසන් කෙරේ. | ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා කළමණාකරණයේ අවදානය යොමු කළ යුතුය. |

**2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන ගැටළුව | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ඊකියා අපේක්ෂිත විශේෂ හැකියාවන් සහිත සිසුන් සඳහා බහුවිධ ප්‍රවේශවීම් සහ පිටවීම් අවස්ථාව ලබා දීම සඳහා විශේෂ කුසලතා හා කර්මාන්තයේ අවශ්‍යතා අනුව පුහුණු කිරීම සඳහා රු.මිලියනයක් වෙන් කර තිබුණද කාර්්‍ය සාධනයක් සිදු වී නොතිබුණි. | පුහුණු මධ්‍යස්ථාන දැනුවත් කර පාඨමාලා ආරම්භ කිරීමට උපදෙස් දුන් අතර පවතින කොවිඩ් -19 වසංගතය හේතුවෙන් සිසුන් සහභාගී නොවීම හේතුවෙන් පුහුණු වැඩසටහන් සාර්ථක නොවීය. | අපේක්ෂිත ප්‍රතිඵලය ලබා ගැනීම සඳහා අවධානය යොමු කළ යුතුය. |
| (ආ) | ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව උතුරු මැද සහ ඌව පළාත්වල පුහුණු මධ්‍යස්ථාන 4 ක පුහුණු පාඨමාලා පහක් සඳහා අතිරේක භෞතික සම්පත් සහ කණ්ඩායම් | මොණරාගල පුහුණු මධ්‍යස්ථානය - මෙම පුහුණු මධ්‍යස්ථානයේ සිදු කෙරෙන ඉදිකිරීම් කටයුතු සහ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් උපකරණ මිලදී ගැනීමට නොහැකි විය. | අදාළ පාඨමාලා ආරම්භ කිරීමට වහාම පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හඳුනා ගැනීමට රු.මිලියන 4 ක් වෙන් කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දී භෞතික සම්පත් සහ කණ්ඩායම් හඳුනා ගැනීමට නොහැකි වී තිබුණි. | හොරොව්පතාන පුහුණු මධ්‍යස්ථානය - මේ සඳහා එස්එස්ඩීපී අරමුදල් වෙන් කර නොතිබූ බැවින් අයවැය බාධක හේතුවෙන් අවශ්‍ය ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ නොහැකි විය.<br>ඔරුබැඩිවැව පුහුණු මධ්‍යස්ථානය - යන්ත්‍රෝපකරණ පාඨමාලාව ආයතනික අරමුදල් වලින් වැඩි දියුණු කර ඇත.<br>උලපනේ පුහුණු මධ්‍යස්ථානය- ජනවාරි මාසයේදී නවීකරණය කිරීමේ කටයුතු යෝජනා කළද, නව කළමනාකරණය විසින් සකස් කරන ලද සම්පූර්ණ තාර්කිකකරණ සැලැස්ම තුළ පාඨමාලා නැවත සැලසුම් කරන ලදී. | |
| (ඇ) | නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යටතේ රු.මිලියන 757 ක ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් වටිනාකමක් මත ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ ඉදිකරනු ලබන ශිෂ්‍ය නේවාසිකාගාරය 2020 ඔක්තෝබර් 30 දින නිම කිරීමට නියමිතව තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි භෞතික ප්‍රගතිය සියයට 65 විය. | ජෛව බුබුලු සංකල්පය යටතේ ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු කෙරෙමින් පවතින අතර වර්තමානයේ භෞතික ප්‍රගතිය සියයට 70 වේ. | ඉදිකිරීම්කරුට පවරා ඇති වැඩ කටයුතු අඛණ්ඩව අධීක්ෂණය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතුය. |
| (ඈ) | තත්ත්ව කළමනාකරණ පද්ධතිය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා තත්ත්ව වැඩි දියුණු කිරීමේ පද්ධති (QIS) 2017 වසරේ සිට හඳුන්වා දී තිබුණි ද සමාලෝචිත වසර අවසන් වන තුරු පද්ධති ස්ථාපනය කර තත්ත්ව සහතික ලබා ගැනීමට ලංකා ජර්මානු කාර්මික පුහුණු ආයතනය කටයුතු කර නොතිබුණි. | සේවක හිඟය හේතුවෙන් අභ්‍යන්තර සිසුන් පුහුණු කිරීම සඳහා පුහුණු සපයන්නන් පූර්ණ කාලීනව යෙදී සිටිති. තත්ත්ව වැඩිදියුණු කිරීමේ පද්ධතිය දිගු කාලීන සංකල්පයක් වන අතර එය ක්‍රමයෙන් හඳුන්වා දිය යුතුය. ගෝලීය වසංගතයේ බලපෑම හේතුවෙන් ක්‍රියාවලිය තවදුරටත් ප්‍රමාද වීමට හේතු වී තිබේ. | අපේක්ෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ව්‍යාපෘති ප්‍රගති වාර්තාවට අනුව, ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයේ සමාලෝචිත වර්ෂයේ සමත්වූ සිසුන්ගේ රැකියා දත්ත එකතු කිරීමේ ප්‍රගතිය සියයට 35 විය. | පහත සඳහන් කරුණු නිසා අඩු දත්ත එකතු කිරීමේ අනුපාතයක් ඇති වේ.ලිපිනය වෙනස් කිරීම, සම්බන්ධතා අංකය වෙනස් කිරීම හෝ සංක්‍රමණය වීම හේතුවෙන් සිසුන් සොයා ගැනීමට ඇති අපහසුව සීජීටීටීඅයි විසින් අපේක්ෂිත සමාගම් වෙත යන සිසුන්ගේ විස්තර ලබා දෙන අතර ඔවුන් බඳවා ගත් පසු විස්තර සීජීටීටීඅයි වෙත දැනුම් දෙන ලෙස සේවායෝජකයාගෙන් ඉල්ලයි. කෙසේ වෙතත්, සේවා යෝජකයාගේ දුර්වල ප්‍රතිචාරය හේතුවෙන් සත්‍ය දත්ත සීජීටීටීඅයි වෙත නොලැබුණි. රැකියා අනුපාතය සියයට 95 ක් ලෙස පවත්වා ගෙන යන බව සීජීටීටීඅයි සහතික කරයි. | දත්ත එකතු කිරීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය තුළදී සේවක සම්බන්ධ පුහුණු වැඩසටහන් (ඊඑල්ටීපී) සඳහා රු.මිලියන 69.43 ක් වෙන් කර තිබුණද 2020 වර්ෂය සඳහා පුහුණු ගිවිසුම් කිසිවක් අත්සන් කර නොතිබුණි. එමෙන්ම ඉලක්ක කරගත් පරිදි අතිරේක පුහුණුලාභි 2000 ක් බඳවා ගෙන කොන්ත්‍රාත් ප්‍රදානය කර නොතිබුණි. | 2020 වර්ෂයේදී කොන්ත්‍රාත් 2000 ක් ප්‍රදානය කිරීමට සැලසුම් කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. එහෙත්, කොවිඩ්-19 වසංගතයේ බලපෑමත් සමඟම, මාස 3 කටත් වැඩි කාලයක් රට වසා දමා තිබූ අතර වසර පුරාම පුහුණු මධ්‍යස්ථාන වසා දමන ලදී. ණය ගිවිසුමට අනුව, එස්එස්ඩීපී 30/06/2021 වන විට එහි කටයුතු අවසන් කිරීමට සිදු විය. කොවිඩ්-19 වසංගත ක්‍රියාකාරකම් ප්‍රමාද විය. එම නිසා ප්‍රසම්පාදනය අවසන් අදියරේදී අත්හිටුවා ඇත. | වැඩසටහනේ ඉලක්ක සපුරා ගැනීම සඳහා කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | කාර්මික ආයතනවල සේවය කරන කාර්ය මණ්ඩලයේ නිපුණතාවය වැඩි දියුණු කිරීමට සහ සහතිකලාභින්ගේ නිපුණතා පරතරය අවම කිරීම සඳහා නම්‍යශීලී පුහුණු වැඩසටහන් සඳහා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 13.889 ක් වෙන් කර තිබුණද එයින් රු. මිලියන 0.0195 ක් වැය කර තිබුණි. එමෙන්ම කාර්මික අංශයේ නියුතු 2000 ක නම්‍යශිලි පුහුණු වැඩසටහන් තුළින් පුහුණුව ලබාදිමේ ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය. | ඉලක්ක පසුගාමී වීමට ප්‍රධාන හේතු නම් කොවිඩ් -19 වසංගතය හේතුවෙන් කර්මාන්තයට ඇති අහිතකර බලපෑම සහ පුහුණු සපයන්නන් (රාජ්‍ය හා පෞද්ගලික) වසා දැමීම ය. තවද, වර්තමාන තත්ත්වය යටතේ බොහෝ කර්මාන්ත අංශ තම සේවකයින්ගේ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා ආයෝජනය කිරීමට කැමැත්තක් දැක්වූයේ නැත. එම නිසා සැලසුම් කළ ඉලක්ක සපුරා ගැනීම ඉතාමත් අසීරු වූ අතර අයවැය ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගත නොහැකි තරම් විය. | අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා අවධානය යොමු කළ යුතුය. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය තුල අවම වශයෙන් මධ්‍යස්ථාන 300 ක වැඩි දියුණු කරන ලද නව තත්ත්ව වැඩිදියුණු කිරිමේ පද්ධතිය ස්ථාපිත කිරිම ඉලක්ක වුවද සමාලෝචිත වර්ෂය අවසන් වනවිට මධ්‍යස්ථාන 232 ක පමණක් තත්ත්ව වැඩිදියුණු කිරිමේ පද්ධති ස්ථාපිත කර තිබුණි.එමෙන්ම පුහුණු මධ්‍යස්ථාන වල තත්ත්ව පාලනය වැඩි දියුණු කිරීම සඳහා අවම වශයෙන් තත්ත්ව සන්නාම නියෝජිතයන් 200 දෙනකු පත් කළ යුතුව තිබුණද, 106 දෙනකු පමණක් පත් කර තිබුණි. | කොරෝනා වසංගතය හේතුවෙන් 2020 ජනවාරි මාසයේ සිට බොහෝ අවස්ථාවන්හීදී පුහුණු මධ්‍යස්ථාන වසා දමා තිබුණි. එබැවින් පුහුණු මධ්‍යස්ථාන වල තත්ත්ව වැඩිදියුණු කිරීමේ පද්ධති ස්ථාපිත (QIS) සඳහා අත්‍යවශ්‍ය ස්ථාන නැරඹීම සහ ගුණාත්මක නියෝජිතයන් පත් කිරීම කළ නොහැක. | පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් හා ගුණාත්මක නියෝජිතයන් බඳවා ගත යුතුය. |